# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2327/36 - 2023 අප්‍රේල් මස 12 වැනි බදාදා - 2023.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**එල්. ඩී. බී. 4/2011**
**විධාන අංකය :- 88**

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**
**10(1) වන වගන්තිය යටතේ වූ විධානය**

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපති, ශාන්ත නිරිඇල්ල වන මා විසින් පාරිභෝගිකයාගේ ආරක්ෂාව සඳහා -

(අ) සාදන්නකු හෝ වෙළෙන්දකු විසින් ලිහිසි තෙල් හෝ ග්‍රීස් සෑදීම හෝ ආනයනය කිරීම, 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව පනතේ 5ඇ වගන්තිය යටතේ සාදන ලදුව 2006 ජූලි මස 12 වන දින අංක 1453/6 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද නියමයට අනුකූලව, සාදන්නකු හෝ වෙළෙන්දකු විසින්, තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා රජය සමග ඒ සඳහා එළඹි වලංගු ගිවිසුමක අධිකාරිය යටතේ මිස නොකළ යුතු බවට ; සහ

(ආ) ලිහිසි තෙල් හෝ ග්‍රීස් ඒකකයක් (අ) ඡේදයේ දක්වා ඇති එකී ගිවිසුමේ අංකය ප්‍රදර්ශනය කරමින් මුද්‍රණය කිරීමෙන් හෝ බහාලුමට, ඇසුරුමට හෝ දවටනයට තදින් ඇලවූ ලේබලයක් මගින් සටහන් කර ඇත්නම් මිස, ගබඩා කිරීම, විකිණීම, ඇසුරුම් කිරීම හෝ විකිණීම සඳහා නැවත ඇසුරුම් කිරීම හෝ විකිණීමේ කාර්යය සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට,

මෙයින් විධානය කරනු ලැබේ.

**ශාන්ත නිරිඇල්ල,**
සභාපති,
පරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

2023 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 04-0085